*සැ. යු.* — 2014.09.05 දින පළ වූ අංක 1,879 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,880 - 2014 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාදා - 2014.09.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1090 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1096 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | 1108 |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත 2014 අගෝස්තු මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ඔක්තෝබර් මස 03 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 සැප්තැම්බර් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1089 - B 80874— 2,875 (2014/09 )
F 1 –

# තනතුරු ඇබෑර්තු

## නාරම්මල ප්‍රාදේශීය සභාව

ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය හා ශිල්පීය තනතුරු සඳහා බඳවා ගැනීම

නාරම්මල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම උපලේඛනයේ සඳහන් සුදුසුකම් ඇති නාරම්මල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

| | *තනතුරු නාමය* | *තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | වැඩ කම්කරු (III පංතිය, ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන සේවක ගණය) | 02 | අංක 06/2006 (iv) දරන රා.ප.ච. PL-1-2006A වැටුප් කේතය රු.11,730 - 10 x 120 - 10 x 130 10 x 145- 12 x 160 - රු. 17,600 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. ( වෛකල්පිත විෂයන් හැර) |
| 02. | මුරකරු (III පංතිය ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන සේවක ගණය) | 01 | අංක 06/2006 (iv) දරන රා.ප.ච. PL-1-2006A වැටුප් කේතය රු.11,730-10 x 120 - 10 x 130 - 10 x 145- 12 x 160 - රු. 17,600 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර) |
| 03. | විදුලි කාර්මික (III පංතිය ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය සේවක ගණය) | 01 | අංක 06/2006 (iv) දරන රා.ප.ච. PL-2-2006A වැටුප් කේතය රු. 12,210 - 10 x 130 - 10 x 145- 10 x 160 - 12 x 170 - රු. 18,600 | *(අ)* බාහිර අයදුම්කරුවන් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් (2) සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)<br>*(අ) I.* අභ්‍යන්තර අයදුම්කරුවන් පළාත් සභා රාජ්‍ය සේවයේ අදාල ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත්වීම.<br>*II.* මෙම පරිපාටිය ක්‍රියාත්මක දින වන විට ප්‍රාථමික අර්ධ ශිල්පීය තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාල වේ.<br>*(ආ)* දැනට නාරම්මල ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.<br>*(ඇ)* රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ වෘත්තීය පුහුණු ආයතනයක හෝ තෘතීය ආයතනය විසින් පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පීය පිළිබඳ පුහුණු සහතිකයක් ලබා තිබිය යුතු ය.<br>*(ඈ)* පිළිගත් ආයතනයක වසර 02 ක පළපුරුද්දක් ලබා තිබිය යුතු ය. (සහතිකයක් මගින් සනාථ කළ යුතුයි.) |

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

I. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

II. අයදුම්කරුවන් නාරම්මල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුයි. (වසර 03 ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුයි.)

III. අයදුම්පත් භාරගන්නා දිනට වයස අවු. 18ට නොඅඩු සහ අවු. 45 ට නොවැඩි විය යුතුයි.
මෙම බඳවා ගැනීමේ පරිපාටි ක්‍රියාත්මක වන දින වන විට ප්‍රාථමික අර්ධ ශිල්පීය/ශිල්පීය/ශිල්පීය නොවන තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට උපරිම වයස් සීමාව බලනොපායි.

IV. නාරම්මල ප්‍රාදේශීය සභාවේ දැනට තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි විශේෂ අවධානය යොමුකරනු ලැබේ. මුරකරු තනතුර බඳවාගැනෙන්නේ නාරම්මල ප්‍රාදේශීය සභාවේ ඝන අප ද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහාය.

V. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් සිටිය යුතු අතර, දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුයි.

VI. දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම් ඔහු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුයි.

VII. ප්‍රාථමික ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය හා ශිල්පීය බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට එම තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවැති බඳවාගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාල වේ.

VIII. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගැනේ.

03. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :-*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
II. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායකත්වය හිමි වේ.
III. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

04. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට, රජයේ දෙපාර්තමේන්තු නියෝග වලටද වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝග වලටද අනුකූලව ක්‍රියාකිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු යි.

*අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතු ලේඛන :*

අයඳුම්පත්‍රය සමග පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) තම පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය;
(iv) මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් ලබාගත යුතු යි.);
(v) වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුක්ත වූවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.)
මූලික සුදුසුකම් සපුරා ඇති අයඳුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

*අයදුම්කළ යුතු ආකාරය :*

අයඳුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයඳුම්පත් ඉල්ලුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා, 2014.09.26 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, නාරම්මල " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර දී මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ව බලය නාරම්මල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

සී. එම්. ඩී. රම්‍ය කුමාරි,
ලේකම්,
නාරම්මල ප්‍රාදේශීය සභාව,
නාරම්මල.

2014 අගෝස්තු මස 21 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***නාරම්මල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින ප්‍රාථමික ශිල්පීය/ශිල්පීය නොවන/අර්ධ ශිල්පීය ගණයේ..................................***
***තනතුර සඳහා බඳවා ගැනීම***

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ——————————.
02. මුලකුරු සමග නම : ——————————.

03. ස්ථිර ලිපිනය : ——————————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ——————————.
05. උපන් දිනය :
වර්ෂය: ——————————. මාසය: ——————————. දිනය: ——————————.
06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස:
අවුරුදු : ——————————.මාස: ——————————. දින: ——————————.
07. ජාතික හැඳුනුම්පත් අංකය: ——————————.
08. විවාහක/අවිවාහක බව: ——————————.
09. ස්ත්‍රී/පුරුෂ භාවය: ——————————.
10. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන්ද යන වග: ——————————.
11. අධ්‍යාපන සුදුසුකම් (සහතික වල ඡායා පිටපත් අමුණා එවන්න)

අ.පො.ස. සා/පෙළ විභාගය :-
සමත් වර්ෂය: ——————————. විභාග අංකය: ——————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස. උ/පෙළ විභාගය :
සමත් වර්ෂය: ——————————. විභාග අංකය : ——————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

12.1. වෙනත් අධ්‍යාපන සුදුසුකම් : ——————————.
12.2. වෘත්තීය සුදුසුකම්: ——————————.
12.3 සේවා පළපුරුද්ද :
(i) දැනට සේවය කරන ආයතනය : ——————————.
(ii) දැනට දරන තනතුර : ——————————.
(iii) එම තනතුරට පත් වූ දිනය : ——————————.
(iv) මීට පෙර සේවය කරන ලද ස්ථාන හා දරන ලද තනතුරු: ——————————.

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? : ——————————.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බවට ඔප්පු වුවහොත් මා සේවයට බඳවාගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත්වන බවද දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

..........................................මහතා/මහත්මිය මෙනෙවිය මෙම ආයතනයේ..........................................වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරාගත හොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර කිසිඳු දඬුවමකට භාජනය වී නොමැති බව සහතික කරන අතර ඔහු/ඇය විසින් ඉදිරිපත්කර ඇති අයදුම්පත්‍රය නිර්දේශකර ඉදිරිපත් කරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය: ——————————.

09-311

## වයඹ පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### පුත්තලම ප්‍රාදේශීය සභාව

පුත්තලම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා පුත්තලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම් කළ යුතු ආකාරය :-

මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් 2014.09.23 දින හෝ ඊට "පෙර ලේකම්, පුත්තලම ප්‍රාදේශීය සභාව, මදුරන්කුලිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙලවරේ "අයදුම්කරන තනතුර" සඳහන් කල යුතුය. දැනටමත් රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍රය තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. (අයදුම්පත ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල ඉදිරිපත් කල යුතුය.) අසම්පූර්ණ හා පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අවම සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | ප්‍රාථමික ශිල්පීය සේවක ගණය (රියදුරු III පන්තිය) | 01 | PL-3-2006A<br>රු. 12,470 -10 x 130 - 10 x 145 - 10 x 160- 12 x 170 රු. 18,860 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ.) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා ගැනීම හෝ අ.පො.ස. (සා.පෙළ) පෙනී සිටීම හා පිළිගත් ආයතනයක බර වාහන රියදුරෙකු වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම.<br><br>ජාතික කාර්මිකත්ව පුහුණු ආයතනයෙන් රියදුරු පාඨමාලාවක් හදාරා තිබීම.<br><br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද රිය පැදවීමේ නිපුණතාවය පිළිබඳ බලපත්‍රය C, C1,D,D1 කාණ්ඩ සඳහා ලබා තිබිය යුතුය.<br><br>දිවා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් යෝග්‍ය තත්ත්වයෙන් සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.<br><br>අවම උස අඩි 5ක් විය යුතුය.<br><br>මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය. |
| 02. | ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක ගණය (විදුලි කාර්මික III පන්තිය) | 01 | PL-2-2006A<br>රු. 12,210- 10 x 130 - 10 x 145 10 x 160- 12 x 170 රු. 18,860 | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය සමත්ව තිබීම.<br><br>තනතුරේ කාර්ය භාරයට අදාලව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන N,V, Q 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br><br>පිළිගත් ආයතනයක වසර 02ක පළපුරුද්ද (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| 03. | ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක ගණය (ජල පොම්ප ක්‍රියාකරු III පන්තිය) | 01 | PL-2-2006A<br>රු. 12,210- 10 x 130 - 10 x 145 10 x 160- 12 x 170 රු. 18,860 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා ගැනීම.<br><br>පිළිගත් ආයතනයක වසර 02 පළපුරුද්ද (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අවම සුදුසුකම්* |
|---|---|---|---|---|
| 04. | ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණය (පුස්තකාල සහායක III පන්තිය) | 01 | PL-1-2006A රු.11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 -රු. 17,600 | අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් දෙකක්වත් සමත්විය යුතුය. |
| 05. | ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණය (මාර්ග කම්කරු III පංතිය) | 01 | PL-1-2006A රු.11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 -රු 17,600 | අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් දෙකක්වත් සමත්විය යුතුය. |
| 06. | ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණය (කාර්යාල කාර්ය සහායක III පංතිය) | 01 | PL-1-2006A රු.11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 -රු 17,600 | අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් දෙකක්වත් සමත්විය යුතුය. |

02. *බඳවා ගැනීමේ ක්‍රමය .-* අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම කරනු ලැබේ.

03. සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි .- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ/වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

04. වෙනත් පොදු කොන්දේසි ඃ

1. තෝරාගනු ලබන්නේ අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වය. එම කාලය තුලදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටු දායක වේ නම් පරිවාස කලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.
2. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
3. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.
4. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලබයි.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පුත්තලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක ස්ථිර පදිංචි ඇති අයෙකු විය යුතුය. (ඡන්ද නාම ලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)
7. පුත්තලම ප්‍රාදේශීය සභාවේ දැනටමත් ස්ථිර, අනියම්, ආදේශක, දීමනා හෝ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. (සතුටුදායක සේවා කාලයක් තිබූ බවට සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)
8. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වන අවුරුදු පහක කාලය තුළ වරදකට (අවවාද කිරීම් හැර) දඬුවමක් ලබා නැත්තාවූ ද මෙම කාලය තුළ යෙදුන වැටුප් වර්ධක නිශ්චිත දිනට ලබාගත්තාවූ ද සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.
9. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, මුදල් රෙගුලාසි හා රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද, වයඹ පළාත් සභාව හා පුත්තලම ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*05.* අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) පදිංචිය පිළිබඳව ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය;
(iv) සේවා සහතිකය (දැනට රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණි);
(v) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්.

බී. ඒ. නිමල් බමුණුආරච්චි,
සභාපති,
පුත්තලම ප්‍රාදේශීය සභාව,
මදුරන්කුලිය.

2014 අගෝස්තු මස 18 වැනි දින දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*වයඹ පළාතේ රාජ්‍ය සේවයේ පුත්තලම ප්‍රාදේශීය සභාවේ රියදුරු/පුස්තකාල සහයක/විදුලි කාර්මික ශිල්පී/ජල පොම්ප ක්‍රියාකරු/මාර්ග කම්කරු හා කාර්යාල කාර්ය සහයක යන තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍රය*

01. (අ) මුලකුරු සමග නම : ————————————.
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම : ————————————.

02. (අ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ————————————.
(ආ) ස්ථිර පදිංචි ලිපිනය : ————————————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය: ————————————.

04. (අ) උපන් දිනය :
වර්ෂය: ————————————. මාසය: ————————————. දිනය: ————————————.

(ආ) 2014.09.23 දිනට වයස:
අවුරුදු : ————————————.මාස: ————————————. දින: ————————————.

05. ජාතික හැඳුනුම්පත් අංකය: ————————————.

06. විවාහක/අවිවාහක බව: ————————————.

07. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු ද ? එසේ නම් උපතින් ද? ලියාපදිංචි වීමෙන්ද යන වග: ————————————.
ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද ? එසසේ නම් විස්තර : ————————————.

09. අධ්‍යාපන සුදුසුකම් ඃ

(අ) විභාගයේ නම : ————————————.
(ආ) විභාග අංකය: ————————————.
(ඇ) විභාග වර්ෂය: ————————————.
(ඈ) සමත් විෂයයන්: ————————————.

10. වෙනත් සුදුසුකම් : ————————————.

11. ඔබ දැනටමත් මෙහි සේවය කරන්නේ නම් සේවා කාලය, විස්තර හා පත්වීමේ ස්වභාවය (ස්ථිර, අනියම්, තාවකාලික, දීමනා, ආදේශක යන වග) : ————————————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය බව හා එම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත් තෝරාගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ————————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

මෙම ඉල්ලුම්කරු වන ...........................................මහතා/මහත්මිය/ මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ....................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොන ආකාරයෙන් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහතික කරන අතර අයදුම්පත නිර්දේශකර ඉදිරිපත් කරමි/නොකරමි.

————————————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ හෝ බලය
පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

දිනය: ————————————.
පදවි නාමය හා ආයතනය: ————————————.

09-270

# පළාත් පාලන නිවේදන

## පස්ගොඩ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 22 හා 24 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර -

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති මංමාවත/මංමාවත් පස්ගොඩ ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොදා ඇති මෙම මංමාවත/මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට තුන් මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 17 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත/මංමාවත් පස්ගොඩ ප්‍රාදේශීය සභා සතු මංමාවතක්/මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඊශ්වරගේ මහින්ද,
පස්ගොඩ ප්‍රාදේශීය සභාව.

2013 දෙසැම්බර් මස 23 වැනි දින,
ඌරුබොක්ක,
පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ දීය.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | හොරහේන්යාය අතුරු මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | මාවරල බුද්ධි විද්‍යායතනය අසල |
| මාර්ගයේ අවසානය | : | පුවක්ගහහේන මාර්ගය |
| ග්‍රාම නිලධාරී වසම | : | මාවරල |
| මාර්ගයේ දිග | : | මීටර් 2,000 |
| මාර්ගයේ පළල | : | අඩි 12 |

*වම්පස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. එච්. ඒ. කරුණාරත්න මහතා
02. එච්. ඒ. ජොසිහාමි මහත්මිය
03. එච්. ඒ. දිලිනි මහත්මිය
04. කේ. ජී. සිරිසේන මහතා
05. ජේ. කේ. ගාමිණී මහතා
06. එස්. එල්. හිමසේන මහතා
07. එච්. ඒ. ප්‍රගීත් කුමාර මහතා
08. ආර්. ධර්මදාස මහතා
09. එච්. පී. පොඩිඅප්පුහාමි මහතා
10. එච්. එම්. ගැමුණුපාල මහතා
11. එච්. ඒ. ජේමදාස මහතා
12. එම්. ඒ. විමලදාස මහතා
13. එච්. ඒ. ධම්මිකා මහත්මිය
14. ඩබ්. සීලදාස මහතා
15. එච්. ඒ. ජේමදාස මහතා
16. එච්. ඒ. නන්දසේන මහතා
17. එම්. ඒ. හිමසේන මහතා
18. ජී. අනුර ප්‍රියන්ත මහතා
19. පී. එල්. ආරියරත්න මහතා
20. එල්. ජේමදාස මහතා
21. එල්. ගාමිණී මහතා

*දකුණුපස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. පී. ජී. සරත් මහතා
02. එච්. ඒ. ජී. ගාන්ධි සිසිර කුමාර මහතා
03. එච්. ඒ. පී. හේමචන්ද්‍ර මහතා
04. එච්. ඒ. ජී. චන්ද්‍රදාස මහතා
05. එච්. ඒ. සුමිත් මහතා
06. එච්. ඒ. චන්ද්‍රදාස මහතා
07. එච්. ඒ. පී. සිරිපාල මහතා
08. එච්. පී. පොඩි අප්පුහාමි මහතා
09. කේ. රවිඳු ලක්මාල් මහතා
10. එච්. එම්. පියසේන මහතා
11. එච්. එම්. ගැමුණුපාල මහතා
12. එච්. ඒ. ජේමදාස මහතා
13. එම්. ඒ. විමලදාස මහතා
14. විතාරණගේ පියසේන මහතා
15. ඩබ්. ආර්. චන්ද්‍රදාස මහතා
16. කේ. කරුණාදාස මහතා
17. එච්. ඒ. ලීලාරත්න මහතා
18. ඩබ්. කේ. සැම්සන් මහතා
19. එච්. එම්. හේරත්ගේ ආරියදාස මහතා
20. කේ. පියසේන මහතා
21. පී. විජේසිරි මහතා
22. එල්. ආරියරත්න මහතා
23. එල්. ජේමදාස මහතා

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | හීන්දොලවත්ත මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | හීන්දොලවත්ත |
| මාර්ගයේ අවසානය | : | මැකිලියතැන්න පාසල අසල කටුවන පාර |
| ග්‍රාම නිලධාරී වසම | : | හීගොඩ |
| මාර්ගයේ දිග | : | කි. මී. 4 |
| මාර්ගයේ පළල | : | අඩි 24 |

*වම්පස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. දයනිසා ද සිල්වා මහතා
02. එච්. ආර්. පියසේන මහතා
03. ඌරුබොක්ක ඔය
04. මැකිලියතැන්න රජයේ රක්ෂිත කොටස

*දකුණු පස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. දයනිසා ද සිල්වා මහතා
02. එච්. ආර්. පියසේන මහතා
03. ඌරුබොක්ක ඔය
04. මැකිලියතැන්න රජයේ රක්ෂිත කොටස

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | අතුබැකන්ද ග්‍රාමයේ අතුරු පාර |
| මාර්ගයේ ආරම්භය | : | ඌරුබොක්ක කටුවන මාර්ගයේ කුඩාදොල අසල සිට |
| මාර්ගයේ අවසානය | : | උඩුවිල මාර්ගය |
| ග්‍රාම නිලධාරී වසම | : | හීගොඩ |
| මාර්ගයේ දිග | : | කි. මී. 01.9 |
| මාර්ගයේ පළල | : | අඩි 16 |

*වම්පස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. කේ. කේ. ජයන්ත කුමාර මහතා
02. දීප්ති ජයවර්ධන මහතා
03. සෑම් ගුණතිලක මහතා
04. කේ. කේ. දයාසේන මහතා
05. යග්ගහවිට මහතා
06. වී. ජී. සෝමසිරි මහතා
07. කේ. කේ. සරත් මහතා
08. කේ. කේ. අමරසේන මහතා
09. කේ. කේ. නන්දසේන මහතා

*දකුණු පස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. ජනක කුමාර මහතා
02. කේ. කේ. ආරියදාස මහතා
03. කේ. කේ. කුමාරතුංග මහතා
04. කේ. කේ .ජුලියස් මහතා
05. ගුණතිලක මහතා
06. සෑම් ගුණතිලක මහතා
07. කේ. කේ. දයාසේන මහතා
08. යග්ගහවිට මහතා
09. වී. පී. සෝමසිරි මහතා
10. කේ. කේ විජිත මහතා
11. කේ. කේ. සීමාරත්න මහතා
12. කේ. කේ. නන්දසේන මහතා
13. කේ. කේ. සරත් මහතා
14. කේ. කේ. විමලදාස මහතා
15. එම්. කේ. අයි. ප්‍රදීප් කුමාරසිරි මහතා
16. විමලසේන මහතා

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | මාරමන්ඩිය හේන මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | කොටපොල මාතර ප්‍රධාන මාර්ගයේ පාරේ කොරටුව ඉඩම සිට |
| මාර්ගයේ අවසානය | : | තුත්තිරිපිටියහේන ඉංදොල මාර්ගය |
| ග්‍රාම නිලධාරි වසම | : | පස්ගොඩ |
| මාර්ගයේ දිග | : | කි. මී. 01 |
| මාර්ගයේ පළල | : | අඩි 16 |

*වම්පස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. නිහාල් මීනිපුර මහතා
02. වයි. අමාරිස් මහතා
03. ඇම්. ඩී. සුමනසේන මහතා
04. වයි. ජයනේරිස් මහතා
05. බී. ඩබ්ලිව්. විමලසේන මහතා
06. ඇම්. ඩී. සුමනසේන මහතා
07. ඇම්. ඩී. කිත්සිරි මහතා
08. එච්. ඒ. සුමනාවතී මහත්මිය
09. වයි. යසවතී මහත්මිය
10. අමරසේන ගරුසිංහ මහතා

*දකුනුපස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. අයි. මැන්ඩිස් මහතා
02. ජේමාවතී හලානායක මහත්මිය
03. අයි. සුමතිසේන මහතා
04. අයි. අනුර මහතා
05. අයි. ඥාණදාස මහතා
06. අයි. දයාවතී මහත්මිය
07. කේ. එච්. පියසිංහාමි මහතා
08. ඒ. පී. පියදාස මහතා
09. අයි. කිරිහාමි මහත්මිය
10. අයි. ධනපාල මහතා
11. යූ. හරමානිස් මහතා

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | මහ අරඹ මාරමණ්ඩිය හේන මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | පස්ගොඩ පාලම අසල |
| මාර්ගයේ අවසානය | : | තුත්තිරිපිටියහේන මාර්ගය |
| ග්‍රාම නිලධාරි වසම | : | පස්ගොඩ |
| මාර්ගයේ දිග | : | කි. මී. 2 |
| මාර්ගයේ පළල | : | අඩි 12 |

*වම්පස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. නිහාල් මීනිපුර මහතා
02. එම්. ඩී. සුමනසේන මහතා
03. බී, ඩබ්ලිව්. විමලසේන මහතා
04. එම්. ඩී. ඕමන් කිත්සිරි මහතා
05. එච්. ඒ. සුමනාවතී මහත්මිය
06. මැන්ඩිස් හලානායක මහතා
07. අයි. සුමනසේන මහතා
08. කේ. එච්. පියසිංහාමි මහතා
09. ඒ. පී. පියදාස මහතා
10. යූ. හරමානිස් මහතා

*දකුණුපස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. වයි. අමාරිස් මහතා
02. වයි. ජයනේරිස් මහතා
03. එම්. ඩී. සුමනසේන මහතා
04. වයි. යසවතී මහතා
05. අමරසේන ගරුසිංහ මහතා
06. ජේමා හලානායක මහත්මිය
07. අයි. අනුර මහතා
08. අයි. ඥාණසේන මහතා
09. අයි. කිරිහාමි මහතා
10. අයි. ධනපාල මහතා

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | පන්සලවත්ත මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | උඩ පස්ගොඩ මාර්ගයෙන් වම් පසින් හමුවන පළමු මාර්ගය |
| මාර්ගයේ අවසානය | : | පන්සල වත්ත ගම්මානය |
| ග්‍රාම නිලධාරි වසම | : | පස්ගොඩ |
| මාර්ගයේ දිග | : | කි. මී. 1 |
| මාර්ගයේ පළල | : | අඩි 16 |

<u>වම්පස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :</u>

01. කේ. ඒ. නිමල් මහතා
02. පී. එම්. කේ. ඒවින්ද සිල්වා මහතා
03. ඉංදොල වතුයාය
04. අයි. ජිනදාස මහතා
05. වයි. ජයන්ත මහතා
06. ඩබ්ලිව්. සිරිසේන මහතා
07. අයි. උපාලි ඉන්ද්‍රරත්න මහතා
08. වයි. විලියම් මහතා
09. අයි. ඩී. ධර්මසිරි මහතා
10. ඒ. ඩී. රුවන් සම්පත් මහතා
11. එම්. පී. විජේතුංග මහතා

12. වයි. ලලිතානන්ද මහතා
13. අයි. ඩී. සංජය නිරෝෂන් විජේතිලක මහතා
14. අයි. මාටින් මහතා

*දකුණුපස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. නන්දනී රුබසිංහ මහත්මිය
02. යූ. ආරියවතී මහත්මිය
03. ඩබ්ලිව්. කරුණාසීලි මහත්මිය
04. එම්. එච්. පියදාස මහතා
05. ඒ. කේ වීරරත්න මහතා
06. වයි. චමින්ද මහතා
07. ඒ. පී චන්ද්‍රසිරි මහතා
08. වයි. හරමානිස් මහතා
09. වයි. පේමාවතී මහත්මිය
10. උපාලි ගරුසිංහ මහතා
11. අයි. ඕදිරිස් මහතා
12. අයි. නිමල්සිරි මහතා

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | බුදල්නාගම මහ අරඹ මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසල |
| මාර්ගයේ අවසානය | : | මාරමණ්ඩියහේන මාර්ගය |
| ග්‍රාම නිලධාරි වසම | : | පස්ගොඩ |
| මාර්ගයේ දිග | : | කි. මී. 2 |
| මාර්ගයේ පළල | : | අඩි 24 |

*වම්පස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. රජයේ ඉඩම
02. වයි. මාටින් මහතා
03. ජේ. ජයතිස්ස මහතා
04. ජේ. එස්. කරුණාදාස මහතා
05. කේ. කේ. සමන්ත මහතා
06. එල්. එච්. රේණුකා මහත්මිය
07. එම්. එච්. කුලසිරි මහතා
08. ආර්. පේමදාස මහතා
09. දයානන්ද අබේනායක මහතා
10. ඩබ්ලිව්. සෝමාවතී මහත්මිය
11. එච්. ඒ. වීරසේන මහතා
12. වයි. එච්. සුසන්ත මහතා
13. හලානායකගේ සාදිනා මහතා
14. ප්‍රියන්ත වීරසිංහ මහතා
15. එච්. ඒ. කරුණාදාස මහතා
16. අයි. ධර්මසිරි මහතා
17. අයි. පේමාවතී මහත්මිය
18. චන්ද්‍රා ගරුසිංහ මහත්මිය

*දකුණුපස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. ජේ. බද්‍රානි මහත්මිය
02. එම්. ඩී. යුනික් වීරසිංහ මහතා
03. එම්. එම්. දයාරත්න මහතා
04. වයි. සී. චන්දන කුමාරසිරි මහතා
05. කේ. ඩී. අමරාවතී මහත්මිය
06. එම්. ජී. ජාලියස් මහතා
07. අයි. සාමෙල් මහතා
08. ධම්මික ලියනගේ මහතා
09. අයි. ධර්මසේන මහතා
10. එම්. ඩී. හේමචන්ද්‍ර මහතා
11. කේ. ඩී. කුලසේන මහතා
12. අයි. පුත්‍රසේන මහතා
13. ඩබ්ලිව්. චන්ද්‍රසේන මහතා
14. එම්. පී. සුමතිපාල මහතා
15. අයි. මාටිං මහතා
16. අයි. සරියාවතී මහත්මිය
17. ඉන්දික හලානායක මහතා
18. අයි. සුමතිසේන මහතා

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | උමන්දොල වරහකන්ද ගල්මෝල මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | කටුවන පාර වරහකන්ද ගල්මෝල අසල |
| මාර්ගයේ අවසානය | : | උඩගොමඩිය බෙංගමුකන්ද මාර්ගය |
| ග්‍රාම නිලධාරි වසම | : | හීගොඩ |
| මාර්ගයේ දිග | : | කි. මී. 04 |
| මාර්ගයේ පළල | : | අඩි 24 |

*වම්පස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. එස්. රණවීර මහතා
02. මලවිගේ ආරියසේන මහතා
03. එච්. ආර්. සුනිල් මහතා
04. එච්. ආර්. පියසේන මහතා
05. දයනිසාද සිල්වා මහතා
06. අනුර ගමගේ මහතා
07. ඩයස් මහතා
08. විමලරත්න මහතා
09. කේ. කේ. නන්දසේන මහතා
10. කේ. කේ. චන්ද්‍රපාල මහතා

*දකුණුපස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. එස්. රණවීර මහතා
02. මලවිගේ ආරියසේන මහතා
03. එච්. ආර්. සුනිල් මහතා
04. එච්. ආර්. පියසේන මහතා
05. දයනිසාද සිල්වා මහතා
06. එච්. ආර්. පියසේන මහතා
07. නිහාල් ගමගේ මහතා
08. කේ. කේ. මහින්ද මහතා
09. විමලරත්න මහතා
10. කේ. කේ. නන්දසේන මහතා
11. කේ. කේ. චන්ද්‍රපාල මහතා

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | තුත්තිරිපිටියහේන ඉංදොල මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | පස්ගොඩ පාලම අසල |
| මාර්ගයේ අවසානය | : | ඉංදොල මංසන්ධිය |
| ග්‍රාම නිලධාරි වසම | : | පස්ගොඩ |
| මාර්ගයේ දිග | : | කි. මී. 02 |
| මාර්ගයේ පළල | : | අඩි 16 |

*වම්පස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. යූ, සුභද්‍රා මහත්මිය
02. ඩබ්ලිව්. ලලිතා මිය
03. එච්. ඒ. නංගිරා මහත්මිය
04. එච්. ඒ. කරුණාදාස මහතා
05. වයි. දිනෝරිස් මහතා
06. වයි. විජේතුංග මහතා
07. අයි. පේමසිරි මහතා
08. එච්. ඒ. උපසේන මහතා
09. අයි. සෝමදාස මහතා

10. ජේ. හෙන්ද්‍රික් මහතා
11. ඒ. වයි. නිශාන්ත මහතා
12. කේ. පී. සමින්ද මහතා
13. අමරතුංග විතාරණ මහතා
14. ආරියවතී සමසිංහ මහත්මිය

*දකුණු පස ඉඩම් හිමියන්ගේ නාමලේඛනය :*

01. එම්. ඩී. චන්ද්‍රසිරි මහතා
02. වයි. උදේනිස් මහතා
03. අයි. වයි. සිරිසේන මහතා
04. වයි. සුමතිපාල මහතා
05. අයි. හරමානිස් මහතා
06. අයි. ධනපාල මහතා
07. යූ, හරමානිස් මහතා
08. ජගත් වීරවංශ මහතා
09. වයි. කුලසිරි මහතා
10. ඒ. වී. පේමසිරි මහතා
11. එල්. ගුණසිරි මහතා
12. චෛතියකන්දාරාමය
13. කේ. පී. සිරිපාල මහතා
14. තේසිං ගරුසිංහ මහතා
15. ඉංදොලවත්ත

09-224

---

**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව වසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාල ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දන්වන අතර, ඉදිරියේ දී මෙම මාර්ගවලට අයත් ඉඩම් වලින් අදාල බිම් ප්‍රමාණය අත්පත් කර ගැනීමට කටයුතු යොදන බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

සභාපති/ලේකම්,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

***උපලේඛනය***

*කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව - මාර්ග ලියාපදිංචි කිරීම*

| *පාරේ නම* | *ග්‍රාම නිලධාරී වසම* | *දෙපස ඇති ඉඩම්* | | *ආරම්භය* | *අවසානය* | *දුර* | *පළල* |
|---|---|---|---|---|---|---|---|
| | | *වම* | *දකුණ* | | | *කි. මීටර්* | *මීටර්* |
| රුහුණේ ගෙදර පාර | කරපුටුගල උතුර | කෝපිවත්ත කොනේවත්ත රිල්ලකැටිය පාලුවත්ත | පැලපොල් කොරටුව පාලුවත්ත | කෝපිවත්තෙන් පැලපොල් කොරටුව හරහා රුහුණේ ගෙදර | පාලුවත්ත | කි. මී. 01 | මීටර්. 4.20 |

09-223

---

**මහනුවර මහ නගර සභාව**

අම්පිටිය රජපිහිල්ල මාවතේ ගිණිහිරියට පිවිසෙන මාර්ගයේ මීටර් 30ක් පමණ දුරින් දකුණට හැරී ගමන් ගන්නා මාර්ගය මහා නගර සභාවට පවරා ගැනීම

ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහනුවර මහ නගර සභා සීමාවේ රජපිහිල්ල මාවතේ සිට ගිණිහිරිය දක්වා වූ මාර්ගයෙන් පටන් ගන්නා, බලයලත් මිනින්දෝරු පී. ආර්. ඩබ්. එම්. වීරකෝන් මහතාගේ 1985.12.26 දිනැති අංක 8152 දරන පිඹුරේ සඳහන් පහත උපලේඛනයේ දැක්වෙන මාර්ගය මහනුවර මහ නගර සභාවට පවරා ගැනීම, 2014.03.31 දින අංක 8(53) දරන සභා සම්මුතිය අනුව සභා සම්මත වී ඇත.

මෙම මාර්ගය මහනුවර මහ නගර සභාව වෙත පවරා ගැනීම සම්බන්ධව ගැසට් නිවේදනය පළ වී මාසයක කාලයක් තුළ විරෝධතා ඇත්නම් “නාගරික කොමසාරිස්, මහනගර සභාව, මහනුවර” යන ලිපිනයට දන්වා එවන ලෙස මෙයින් දන්වා සිටිමි.

එම කාල සීමාව තුළ විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් මහ නගර සභා ආඥා පනතේ 48(1), (2), (3), (4) උපවගන්තිය යටතේ මහනුවර මහනගර සභාව වෙත මෙම මාර්ගය පැවරෙන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

රජපිහිල්ල මාවතේ සිට ගිණිහිරිය දක්වා දිවෙන මාර්ගයේ මීටර් 30ක් පමණ දුරින් උතුරු බස්නාහිර දිශාවට පටන් ගන්නාවූ මාර්ගය බලයලත් මිනින්දෝරු පී. ආර්. ඩබ්. එම්. වීරකෝන් මහතාගේ 1985.12.26 දිනැති අංක 8152 දරන පිඹුරේ සඳහන් පරිදි මායිම් උතුරින් එම පිඹුරේ ලොට් අංක 1 ද, දකුණින් එම පිඹුරේ ලොට් අංක 2 නැවත බස්නාහිරින් ඩෝවින් එස්ටේට්හි ඉතිරි කොටස හා ලොට් අංක 4 ද, නැගෙනහිරින් ලොට් අංක 2 හා 3 ද, නැවත උතුරින් ලොට් අංක 4 ද, දකුණින් ලොට් අංක 5 නැවත බස්නාහිරින් ලොට් අංක 8,9,10 හා නැගෙනහිරින් ලොට් අංක 4 ද, නැවත උතුරින් ලොට් අංක 11 හා දකුනින් ලොට් අංක 10ට මායිම් වූ මීටර් 600ක් දිග එම පිඹුරේ ලොට් අංක 14,15,16 ලෙස දැක්වෙන පිළිවෙලින් රූඩ් 01, පර්චස් 31, රූඩ් 1 පර්චස් 17.5 හා පර්චස් 20.5 වන මාර්ගය.

චන්දන තෙන්නකෝන්,
නාගරික කොමසාරිස්,
මහනුවර

09-221

---

### අරණායක ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24(2) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ, කෑගලු දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොදා ඇති මෙම මංමාවත/මංමාවත් සම්බන්ධයෙන් අදාල ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට තුන් මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 17 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරන බව, පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ආර්. දිනේෂ් ගුණරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
අරණායක.

2014 අගෝස්තු මස 13 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | පැහිනිපැද්දර මුත්තෙට්ටුහේන හරහා මා ඔයට යන මාර්ගය |
| මාර්ගයේ ආරම්භය සහ අවසානය | :- | පැහිනිපැද්දර පන්සල අසල පාලම අසල සිට මුත්තේට්ටුවේ හේන දක්වා මාර්ගය |
| ග්‍රාමසේවා වසම හා අංකය | :- | 45සී පැහිනිපැද්දර |
| මාර්ගයේ දිග හා පළල | :- | මීටර් 238, අඩි 08 |

*මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :*

| | | |
|---|---|---|
| 1. | ඊ. ජී. ජයතිලක මයා | කොස්ගහමුලහේන දෙනිය ඉඩම |
| 2. | ඊ. පී. කුලරත්න මයා | අගලකොටුව ඉඩම |
| 3. | එස්. පී. බිලිඳු මයා | අගලකොටුව ඉඩම |
| 4. | ඩී. පී. අජිත් කුමාර මයා | දෙහිගහමුලහේන ඉඩම |
| 5. | ඩබ්. පී. රණසිංහ මයා | දෙහිගහමුලහේන ඉඩම |
| 6. | ඩබ්. පී. ගුණතිලක මයා | දෙහිගහමුලහේන ඉඩම |
| 7. | පී. සී. ක්‍රිස්ටා මයා | දෙහිගහමුලහේන ඉඩම |
| 8. | ඩබ්. පී. ජයසේන මයා | දෙහිගහමුලහේන ඉඩම |

*මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :*

| | | |
|---|---|---|
| 1. | ඩී. මහින්ද භාරතී හිමි | බෝමළුවේ හේන ඉඩම |
| 2. | එම්. පී. ගුණසේන මයා | බෝමළුවේ හේන ඉඩම |
| 3. | එල්. විමලදාස මයා | තේ වත්ත ඉඩම |
| 4. | ඊ. පී. සෝමලතා මිය | බෝගහමුලහේන ඉඩම |
| 5. | ඩබ්. පී. රණසිංහ මයා | මත්තෙට්ටුවේ හේන ඉඩම |
| 6. | ඩබ්. පී. ප්‍රේමදාස මයා | මත්තෙට්ටුවේ හේන ඉඩම |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතාගේ 2014.02.08 දිනැති අංක 43/2014 දරන පිඹුරුපත පරිදියි.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | වහරක්ගොඩ නාගහමුලතැන්න මාර්ගය |
| මාර්ගයේ ආරම්භය සහ අවසානය | :- | අරණායක පාරේ වහරක්ගොඩ උතුවන්කන්ද මාර්ගයේ මධ්‍යයේ සිට ඒ. ඩබ්. ජී, යසෝ මැණිකේ මහත්මියගේ නිවස අසලින් ගල් අමුණ ඇළ දක්වා |
| ග්‍රාමසේවා වසම හා අංකය | :- | 17සී වහරක්ගොඩ |
| මාර්ගයේ දිග හා පළල | :- | මීටර් 407, අඩි 12 |

*මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :*

| | | |
|---|---|---|
| 1. | ආර්. ජී. විජේරත්න මයා | මුදුනේපිට හේන ඉඩම |
| 2. | ආර්. ජී. ඩී. රාජමන්ත්‍රී මයා | මුදුනේපිට හේන ඉඩම |

| | | |
|---|---|---|
| 3. | ඩී. එච්. එන්. ආරියරත්න මයා | මුදුනේපිට හේන ඉඩම |
| 4. | එච්. ජී. වීරසේන මයා | මුදුනේපිට හේන ඉඩම |
| 5. | එම්. අයි. කේ. පියරත්න මයා | උඩවත්ත ඉඩම |
| 6. | එන්. ඩබ්. සුමනාවතී මිය | උඩවත්ත ඉඩම |
| 7. | බී. ජී. විජේවර්ධන මයා | හිටිනාවත්ත ඉඩම |
| 8. | එන්. ඩබ්. එල්. හඳා අමරකාන්ති මිය | හිටිනාවත්ත ඉඩම |
| 9. | ආර්. ජී. තිලකරත්න මයා | ඉඹුල්ගහවත්ත ඉඩම |
| 10. | එම්. අයි. කේ. පියරත්න මයා | නාගහමුලතැන්න ඉඩම |
| 11. | ආර්. ජී. ලයනල් මයා | කෝපිවත්ත ඉඩම |
| 12. | ඩබ්. එම්. පුෂ්පලතා මිය | කිරිපොලේ කුඹුර ඉඩම |

<u>මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම් :</u>

| | | |
|---|---|---|
| 1. | ඒ ඩබ්. ඩී. ජී යසෝමැණිකේ මිය | සිත්තරගෙවත්ත ඉඩම |
| 2. | යූ. ඒ. කුමාරසිරි මයා | සිත්තරගෙවත්ත ඉඩම |
| 3. | කේ. ඒ. සුනිල් ශාන්ත ජයසිංහ මයා | තලගහමුලවත්ත ඉඩම |
| 4. | ජී. එච්. ජී. සී. ප්‍රේමවංශ මයා | තලගහමුලවත්ත ඉඩම |
| 5. | ජී. එච්. ලීලාවතී මිය | හිටිනාවත්ත ඉඩම |
| 6. | බී. ජී. සෝමතිලක මයා | හිටිනාවත්ත ඉඩම |
| 7. | බී. ජී. විජේවර්ධන මයා | හිටිනාවත්ත ඉඩම |
| 8. | ආර්. ජී. අබේරත්න මයා | මීගහවත්ත ඉඩම |
| 9. | ඩබ්. එම්. ජී. වීරකෝන් මයා | නාගහමුලතැන්න ඉඩම |
| 10. | පී. ජී. ආර්. කේ. එස්. බණ්ඩාර මයා | නාගහමුලතැනන් ඉඩම |
| 11. | ඩබ්. එම්. ජී. වීරකෝන් මයා | නාගහමුලතැන්න ඉඩම |
| 12. | එම්. අයි. කේ. පියරත්න මයා | නාගහමුලතැන්න ඉඩම |
| 13. | ජී. ජී. සෙනවිරත්න මයා | නාගහමුලතැන්න ඉඩම |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතාගේ 2014.02.08 දිනැති අංක 50/2014 දරන පිඹුරුපත පරිදියි.

09-220

---

## කෑගල්ල නගර සභාව

1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයෙහි නම සඳහන් තැනැත්තා විසින් එහි නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාව එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2015 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට මා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත 06 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලාව අසල හෝ එකී සමාජ ශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය අසල පදිංචි යම් තැනැත්තෙකු විසින් එම සමාජ ශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට සති හතරක් (04) ඇතුළත තම විරුද්ධතාවයට හේතුව ලියවිල්ලකින් දන්වමින් පිටපත් දෙකකින් යුතු මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ.

පී. කේ. සමරසිංහ,
සභාපති,
නගර සභාව - කෑගල්ල.

2014 අගෝස්තු මස 14 වැනි දින,
කෑගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *සමාජ ශාලාවේ සභාපති/ලේකම්* | *සමාජ ශාලාවේ නම* | *සමාජ ශාලාවේ නව කටයුතු කරගෙන යාමට බලය/පවත්වන ස්ථානය* |
|---|---|---|---|
| මෛත්‍රී අතුරුපාන, අංක 343/7, රංවල, කෑගල්ල | ලේකම් | කෑගල්ල වැවිලිකරුවන්ගේ සමාජය | අංක 39, ස්වර්ණ ජයන්ති මාවත, කෑගල්ල. |

09-282

---

## පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව - රඹුක්පිටිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු මාර්ගයන් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ ජනතාව විසින් හෝ මාවතකට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විරුද්ධත්වයක් පල කරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරන දින සිට එක් මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියාත්මක කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මෙම කාල සීමාව තුළදී මෙම නිවේදනය පිළිබඳ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මාර්ගය පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු මාර්ගයන් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති.


2014 අගෝස්තු මස 25 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

| *අනු . අංකය* | *ග්‍රාම නිලධාරි වසම* | *පාරේ නම* | *ආරම්භය* | *අවසානය* | *පාරේ දිග හා පළල* | *දෙපස ඉඩම් හිමියන්* | |
|---|---|---|---|---|---|---|---|
| 01 | වැලිගොඩවත්ත | ෂෙම්රොක් වැඩිහිටි නිවාස පාර | දොළොස් බාගේ පාර වැඩිහිටි නිවාස පාර | ෂෙම්රොක් ගම | දිග මී. 1417.2 පළල මී. 4.57 | වම | දකුණ |
| 1. | ppමහ463-ලොට්58 | 1. | ppමහ463- ලොට්57 | | | | |
| | | | | | | 2. ppමහ463-ලොට්62 | 2. ppමහ463- ලොට්65 |
| | | | | | | 3. ppමහ463-ලොට්63 | 3. ppමහ463- ලොට්68 |
| | | | | | | 4. ppමහ463-ලොට්75 | 4. ppමහ463- ලොට්69 |
| | | | | | | 5. ppමහ463-ලොට්74 | 5. ppමහ463- ලොට්70 |
| | | | | | | 6. ppමහ463-ලොට්73 | 6. ppමහ463- ලොට්58 |
| | | | | | | 7. ppමහ463-ලොට්72 | 7. ppමහ714- ලොට්6 |
| | | | | | | 8. ppමහ463-ලොට්71 | 8. ppමහ463- ලොට්82 |
| | | | | | | 9. ppමහ463-ලොට්77 | 9. ppමහ463- ලොට්83 |
| | | | | | | 10. ppමහ463-ඇල | 10. ppමහ463- ලොට්84 |
| | | | | | | 11. ppමහ463-ලොට්78 | 11. ppමහ463- ලොට්85 |
| | | | | | | 12. ppමහ463-ලොට්81 | 12. ppමහ463- ලොට්99 |
| | | | | | | 13. ppමහ463-අතුරු පාර ලොට්79 | 13. ppමහ463-ලොට්103 |
| | | | | | | 14. ppමහ463-ලොට්87 | 14. ppමහ463- ලොට්105 |
| | | | | | | 15. ppමහ463-ලොට්86 | 15. ppමහ463- ලොට්123 |
| | | | | | | 16. ppමහ463-ලොට්98 | 16. අතුරු පාර |
| | | | | | | 17. ppමහ463-අතුරු පාර | 17. ppමහ463-ලොට්129 |
| | | | | | | 18. ppමහ463-ලොට්106 | 18. ppමහ463-ලොට්128 |
| | | | | | | 19. ppමහ463-ලොට්122 | 19. ppමහ463-ලොට්127 |
| | | | | | | 20. ppමහ463-ලොට්132 | 20. ppමහ463-ලොට්162 |
| | | | | | | 21. ppමහ463-ලොට්64 අතුරු පාර | 21. ppමහ463-ලොට්163 |
| | | | | | | 22. ppමහ463-ලොට්130 | 22. ppමහ463-ලොට්164 |
| | | | | | | 23. ppමහ463-ලොට්126 | 23. ppමහ463-ලොට්165 |
| | | | | | | 24. ppමහ463-ලොට්160 | 24. ppමහ463-ලොට්166 |
| | | | | | | 25. ppමහ463-ලොට්159 | 25. ppමහ463-ලොට්167 |
| | | | | | | 26. ppමහ463-ලොට්157 | 26. ppමහ463-ලොට්168 |
| | | | | | | 27. ppමහ463-ලොට්156 | 27. ppමහ463-ලොට්169 |
| | | | | | | 28. ppමහ463-ලොට්153 | 28. ppමහ463-ලොට්170 |
| | | | | | | 29. ppමහ463-ලොට්152 | 29. ppමහ463-ලොට්151 |
| | | | | | | 30. ppමහ463-ලොට්148 | 30. ppමහ463-ලොට්149 |

බලයලත් මිනින්දෝරු පී. ඥානප්‍රකාශම් මහතා විසින් සකස් කරන ලද අංක 10534 හා 2013.04.08 වන දින සැලැස්ම අනුවයි

**P.GNANAPRAKASAM J.P.F.S.I.(SRI LANKA)**
Registered Licensed Surveyor,
No.10, Benedict Avenue,
Bawwagama,
Nawalapitiya.
Tel. 054-3541130 & 077-6056778

**NO.10,534**




Scale: 1 : 4000

# P L A N

SHOWING

Pasbage Korale Pradeshiya Sabha Road called
**'GONAWALAPATANA ELDERS HOME ROAD'**
being Lots 64 & 161 in State Plan No.PP මහ 463 authenticated by the Surveyor General.
To gether with Street Line Limits shown on both side.
Situated Gonawalapatana Village - Within the Limits of Pasbage Korale Pradeshiya Sabha
Within Weligodawatta Grama Niladhari Division No.1102 & Pasbage Korale Divisional Secratariat area.

In
PASBAGE KORALE
**KANDY DISTRICT**
## CENTRAL PROVINCE

**Boundaries :- As described above**

Surveyed on : 28th April,2013

**LENGTH OF THE ROAD :- 1417.2 METERS**

P.GNANAPRAKASAM
Registered Licensed Surveyor
10 Benedict Avenue
Bawwagama, Nawalapitiya
Reg.No. 19670167

2

09- 222/1

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව - රඹුක්පිටිය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු මාර්ගයන් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ ජනතාව විසින් හෝ මාවතකට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විරුද්ධතවායක් පල කරනු ලබන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරන දින සිට එක් මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියාත්මක කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.


මෙම කාල සීමාව තුළදී මෙම නිවේදනය පිළිබඳ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මාර්ගය පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු මාර්ගයන් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,

2014 අගෝස්තු මස 15 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

| *අනු . අංකය* | *ග්‍රාම නිලධාරි වසම* | *පාරේනම* | *ආරම්භය* | *අවසානය* | *පාරේ දිග හා පළල* | *දෙපස ඉඩම් හිමියන්* | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | වම | දකුණ |
| 02 | ගෝනවලපතන | ගෝනවලපතන සුසානභූමි පාර | දොළොස්බාගේ පාර වැඩිහිටි නිවාස පාර හන්දිය | ගෝනවලපතන සුසාන භූමිය | දිග මී. 698.3 පළල මී. 4.57 | | |
| | | | | | | 1. ppමහ8936-ලොට්25 | 1. ppමහ8936-ලොට්26 |
| | | | | | | 2. ppමහ4302-ලොට්60 | 2. ppමහ463-ලොට්50 |
| | | | | | | 3. ppමහ4302-ලොට්59 | 3. අතුරු පාරppමහ463-ලොට්27 |
| | | | | | | 4. ppමහ4302-ලොට්57 | 4. ppමහ463-ලොට්45 |
| | | | | | | 5. ppමහ3751-ලොට්06 | 5. ppමහ463-ලොට් 32 |
| | | | | | | 6. ppමහ3751-ලොට්05 | 6. ppමහ463-ලොට්31 |
| | | | | | | 7. ppමහ3751-ලොට්03 | 7. ppමහ714-ලොට්18 |
| | | | | | | 8. ppමහ3751-ලොට්02 | 8. ppමහ463-ලොට්17 |
| | | | | | | 9. ppමහ3751-ලොට්53 | 9. ppමහ463 -ලොට් 36 |
| | | | | | | 10. අතුරු පාර | 10. ppමහ463-ලොට්16 |
| | | | | | | 11. ppමහ4302-ලොට්52 | 11. ppමහ463-ලොට් 15 |
| | | | | | | 12. ppමහ4302-ලොට්42 | |
| | | | | | | 13. ppමහ4302-අතුරු පාර-ලොට්41 | |
| | | | | | | 14. ppමහ4302-ලොට්40 | |
| | | | | | | 15. ppමහ4302-ලොට්39 | |
| | | | | | | 16. ppමහ4302-ලොට්27 | |
| | | | | | | 17. ppමහ4302-ලොට්26 | |
| | | | | | | 18. ppමහ4302-ලොට්25 | |
| | | | | | | 19. ppමහ4302-ලොට්24 | |
| | | | | | | 20. ppමහ4302-ලොට්23 | |
| | | | | | | 21. ppමහ4302-ලොට්22 | |
| | | | | | | 22. ppමහ4302-ලොට්15-සුසාන භූමි | |

බලයලත් මිනින්දෝරු පී. ඥානප්‍රකාශම් මහතා විසින් සකස් කරන ලද අංක 10690 හා 2013.12.01 වන දින සැලැස්ම අනුවයි


P.GNANAPRAKASAM J.P.F.S.I.(SRI LANKA)
Registered Licensed Surveyor,
No.10, Benedict Avenue,
Bawwagama,
Nawalapitiya.
Tel. 054-3541130 & 077-6056778
NO.10,690
Scale: 1 : 2000
PLAN
SHOWING
Pasbage Korale Pradeshiya Sabha Road called
'GONAWALAPATANA CEMETERY ROAD'
being part of Lots 16,54,58 ( in full ) in State
Plan No.PP මහ 4302 dated 13th August,1995,
& Lot 4 in State Plan No. PP මහ 3751 dated 13th July,1995
authenticated by the Surveyor General.
To gether with Street Line Limits shown on both side.
Situated Gonawalapatana Village -
Within the Limits of Pasbage Korale Pradeshiya Sabha
Within Weligodawatta & Dandubendiruppa Grama Niladhari
Divisions Nos.1102,1103 &
Pasbage Korale Divisional Secratariat area.
In
PASBAGE KORALE
KANDY DISTRICT
CENTRAL PROVINCE
Boundaries :- As described above
Lot 22 in PP මහ 4302
Lot 15 in PP මහ 4302
CEMETERY
Lot 15 in PP මහ 463
Lot 23 in PP මහ 4302
Lot 16 in PP මහ 463
Lot 24 in PP මහ 4302
Lot 36 in PP මහ 8936
Lot 25 in PP මහ 4302
Lot 17 in PP මහ 463
Lot 26 in PP මහ 4302
Lot 27 in PP මහ 4302
Lot 18 in PP මහ 463
Lot 39 in PP මහ 4302
Lot 40 in PP මහ 4302
Lot 31 in PP මහ 463
Lot 41 in PP මහ 4302
Lot 42 in PP මහ 4302
Lot 32 in PP මහ 463
Lot 52 in PP මහ 4302
ROAD
Lot 53 in PP මහ 4302
Lot 2 in PP මහ 3751
Lot 3 in PP මහ 3751
Lot 45 in PP මහ 463
GONAWALAPATANA CEMETERY ROAD
Lot 5 in PP මහ 3751
LENGTH OF THE ROAD :- 698.3 METERS
Lot 6 in PP මහ 3751
Lot 57 in PP මහ 4302
Lot 47 in PP මහ 463
ROAD
Lot 59 in PP මහ 4302
Reference:
(H) Highways
LF Live Fence
Lot 50 in PP මහ 463
Surveyed on : 01st December,2013
Lot 60 in PP මහ 4302
F.GNANAPRAKASAM
Registered Licensed Surveyor
10 Benedict Avenue
Bawwagama, Nawalapitiya
Reg.No. 19670167
Note:
Street Line Limits shown in Red broken Line on my Plan.
Lot 25 in PP 8936
Registered Licensed Surveyor
REGD. NO. 19670167
Lot 26 in PP 8936
ROAD(H)
FROM DOLOSBAGE
ROAD
FROM HOUSES
TO NAWALAPITIYA

09- 222/2

## පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව - රඹුක්පිටිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු මාර්ගයන් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ ජනතාව විසින් හෝ මාවතකට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විරුද්ධතවායක් පල කරනු ලබන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරන දින සිට එක් මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියාත්මක කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

මෙම කාල සීමාව තුළ දී මෙම නිවේදනය පිළිබඳ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මාර්ගය පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු මාර්ගයන් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

2014 අගෝස්තු මස 25 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.


| අනු . අංකය | ග්‍රාම නිලධාරී වසම | පාරේ නම | ආරම්භය | අවසානය | පාරේ දිග හා පළල | දෙපස ඉඩම් හිමියන් - වම | දෙපස ඉඩම් හිමියන් - දකුණ |
|---|---|---|---|---|---|---|---|
| 03. | පල්ලේගම | අන්දන්ගොඩ වත්ත පාර | නාවලපිටිය ගම්පොල ප්‍රධාන පාර | ටිල්ටන් වත්ත | දිග මී. 390.2<br>පළල මී. 3 | 1. මී.සැ.අංක101-ලොට්19<br>2. මී.සැ.අංක101-ලොට්20- අඩිපාර<br>3. මී.සැ.අංක101-ලොට් 8.9,13,14,15 අදරු පාර<br>4. මී.සැ.අංක101-ලොට්5,6,7 | 1. මී.සැ.අංක101-ලොට්21<br>2. මී.සැ.අංක101-ලොට්22<br>3. මී.සැ.අංක101-ලොට්12<br>4. මී.සැ.අංක101-ලොට්11<br>5. මී.සැ.අංක101-ලොට්10<br>6. මී.සැ.අංක101-ලොට්4<br>7. මී.සැ.අංක101-ලොට්3<br>8. මී.සැ.අංක101-ලොට්2 |


| අනු . අකංය | ග්‍රාම නිලධාරී වසම | පාරේනම | ආරම්භය | අවසානය | පාරේ දිග හා පළල | දෙපස ඉඩම් හිමියන් - වම | දෙපස ඉඩම් හිමියන් - දකුණ |
|---|---|---|---|---|---|---|---|
| 03. | | අදරු පාර | අන්දන්ගොඩ වත්ත පාර | ටිලටන් වත්ත | | 1. මී.සැ.අංක101- ලොට් 8, 9, 13, 14 සහ 15<br>2. මී.සැ.අංක101-ලොට්12 | 1. මී.සැ.අංක101- ලොට්5,6 සහ 7 |

බලයලත් මිනින්දෝරු පී. ඥානප්‍රකාශම් මහතා විසින්
සකස් කරන ලද අංක 10509 හා 2013.03.05 වන
දින සැලැස්ම අනුවයි.

**P.GNANAPRAKASAM J.P.F.S.I.(SRI LANKA)**
Registered Licensed Surveyor,
No.10, Benedict Avenue,
Bawwagama,
Nawalapitiya.
Tel. 054-3541130 & 077-6056778

**NO.10,509**






Scale: 1 : 2000

# P L A N

SHOWING

Pasbage Korale Pradeshiya Sabha Road called

**'ANDANGODAWATTA ROAD'**

depicted on Plan No.101 dated 11th to 15th October,1999 by U.Wasala Licensed Surveyor.

To gether with Street Line Limits shown on both side.

Situated Pallegama Village - Within the Limits of Pasbage Korale Pradeshiya Sabha

Within Pallegama Grama Niladhari Division No.1104 & Pasbage Korale Divisional Secratariat area.

In

PASBAGE KORALE

KANDY DISTRICT

## CENTRAL PROVINCE

**Boundaries :- As described above**

**LENGTH OF THE ROAD :- 390.2 METERS**

Surveyed on : 05th March,2013

P.GNANAPRAKASAM
Registered Licensed Surveyor
10 Benedict Avenue
Bawwagama, Nawalapitiya
Reg.No. 19670167

Registered Licensed Surveyor
REGD NO 19670167

06th March,2013

09- 222/3

# අයවැය ලේඛන

**දැන්වීමයි**

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව

**වර්ෂ 2014 පරිපූරක අය- වැය ලේඛනය - 01**

මහ නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරයේ) 214 ඡේදය ප්‍රකාර, දෙහිවල -ගල්කිස්ස මහ නගර සභාවේ 2014 වර්ෂය සඳහා වූ පරිපූරක අය-වැය ලේඛනය - 01 2014 අගෝස්තු මස 29 වන දින සිට සැප්තැම්බර් මස 05 වන දින දක්වා කාර්යාලයීය වේලාව තුළ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති,
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව.

2014 අගෝස්තු මස 26 වැනි දින,
දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

09-310

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.